## විසර්ජන ශීර්ෂය 271 ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

## විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය

### 1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

(i) දිස්ත්‍රික්කය තුල ප්‍රධාන රාජ්‍ය නියෝජිතයා ලෙස ක්‍රියා කිරීම.

(ii) ත්‍රිකුණාමලය දිස්ත්‍රික් හා ප්‍රාදේශීය රාජ්‍ය පරිපාලනය උදෙසා ප්‍රතිපත්ති, සැලසුම් හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

(iii) අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල වැඩසටහන් සම්බන්ධිකරණය කිරීම.

(iv) අනෙකුත් රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදෙන ලද මුදල් හා සෙසු සම්පත් කළමනාකරණය කිරීම.

(v) දිස්ත්‍රිකකය තුල ආපදා සහන සේවා හා පුනරුත්ථාපන වැඩසටහන් පරිපාලනය කිරීම.

(vi) ත්‍රිකුණාමලය දිස්ත්‍රික් විශ්‍රාම වැටුප් ගෙවීම සම්බන්ධිකරණය කිරීම.

(vii) ජාතික හා ප්‍රාදේශීය වශයෙන් වැදගත් උත්සව හා සිදුවීම් ආදිය දිස්ත්‍රික්කය තුළ පැවැත්වීම.

(viii) ආදායම් එකතු කිරීම, බලපත්‍ර හා අවසර පත්‍ර නිකුත් කිරීම හා අලුත් කිරීම සම්බන්ධිකරණය.

(ix) දිස්ත්‍රික් මැතිවරණ කටයුතු සම්බන්ධිකරණය කිරීම.

(x) කාර්ය මණ්ඩල පුහුණු කිරීම හා වෘත්තීය සංවර්ධන වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කිරීම.

### 1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශිය ලේකම් කාර්යාල

(අ) නගර හා කඩවත්

(ආ) පදවි ශ්‍රී පුර

(ඇ) ගෝමරන්කඩවල

(ඈ) කින්නියා

(ඉ) සේරුවිල

(ඊ) මූතූර්

(උ) කන්තලේ

(ඌ) කුච්චවේලි

(එ) මොරවැව

(ඒ) තඹලගමුව

(ඔ) වෙරුගල්

## 1.3 විගණන විෂය පථය

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 සැප්තැම්බර් 05 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්යය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.5 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඉ ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.13 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| වාහන ලේඛනය | මු.රෙ. 1647 (ඉ) |
| ලොග් සටහන් පොත් | මු.රෙ. 1645 (අ), (ආ) සහ (ඇ) |
| හානි ලේඛනය | මු.රෙ. 110 |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| පරිගණක හා උපාංග ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයි ඒ අයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

**(ආ) විසර්ජන ගිණුම**

**(i) මුළු ප්‍රතිපාදනය හා වියදම**

සමාලෝචිත වර්ෂය සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 365,086,685 ක් වූ අතර වර්ෂය අවසාන වන විට ඉන් රු. 329,110,050 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු. 35,976,635 ක් වී තිබුණු අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 ක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 214,150,000 | 253,086,685 | 6,726,608 | 03 |
| මූලධන | 87,000,000 | 112,000,000 | 29,250,027 | 26 |
| **එකතුව** | 301,150,000 | 365,086,685 | 35,976,635 | 10 |

**(ii) අයවැය විචලනය**

වැය විෂයයන් 06 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ත් සියයට 90 අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(iii) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්ත 24 ක් විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත එකතුව රු.648,712,904 ක් වූ ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර, ඉන් රු.569,446,959 ක් හෙවත් සියයට 87 උපයොජනය කර තිබුණි. ඒ අනුව ඉතිරිය රු.79,265,945 ක් හෙවත් සියයට 13 ක් විය.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය විසින් ලබාදී තිබුණු රු.2,123,000 ක ප්‍රතිපාදනය රු.864,888 කින් ඉක්මවා රු.2,987,888 ක් වැයකර තිබුණි. මේ අතර, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් රු.529,738,950 ක ප්‍රතිපාදන ලබාදී තිබුණත් ඉන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය රු.457,873,507 ක් පමණක් හෙවත් සියයට 87 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.71,865,443 ක් හෙවත් සියයට 13 ක් උපයෝජනය කර නොතිබුණි.

(iv) 271-1-1-2102 වැය විෂය යටතේ 2012 දෙසැම්බර් 31 දිනට මු.රෙ. 66 මාරු කිරීම් රු.43,000 ක් වූ අතර එදිනට එම වැය විෂයයේ රු. 1,000,426 ක ඉතිරිවීම් තිබුණි.

(v) වැය විෂය අංක 271-1-1-2502 සඳහා 2012 ඔක්තෝම්බර් 31 දින රු. 25,000,000 ක පරිපූරක ඇස්තමේන්තු අනුමත කර ඇති අතර, එයින් රු. 15,684,517 ක මුදලක් 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරි වී තිබුණ. ඉතිරි වී තිබූ මුදල, පරිපූරක ඇස්තමේන්තුවෙන් සියයට 63 කි.

(vi) වැය විෂය අංක 271-1-1-1003 සඳහා, මු.රෙ. 66 මගින් රු. 600,000 ක්ද , පරිපූරක ඇස්තමේන්තු මගින් රු.37,936,685 ක වශයෙන් රු.38,536,685 ක මුදලක් ප්‍රතිපාදනය කර තිබුණි. මෙය මුල් ඇස්තමේන්තු ප්‍රතිපාදනය සියයට 771 කින් වැඩිවීමකි.

(ඇ) **රජයේ නිළධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

විෂය අංක 27101 දරන රජයේ නිළධාරීන්ට අත්තිකාරම් ගණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | ලැබීම් | හර ශේෂය |
| --- | --- | --- |

| | | | | | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 22,000,000 | 19,931,555 | 14,000,000 | 23,534,638 | 110,000,000 | 70,930,765 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 27101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවිම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.6,154,017ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවැතුණි.

(ii) මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන අයවැය චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනි ලෙස පදවි ශ්‍රී පුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු. 250,000 ඉක්මවා ආපදා ණය ගෙවා තිබුණි.

**(ඇ) අග්‍රිම ගිණුම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුමේ රු.76,558,739 ක් වූ ශේෂ තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2012 නොවැම්බර් 20 දිනැති අංක 05/2012 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය ප්‍රකාරව, දෙසැම්බර් 31 දිනට තිබූ අග්‍රිම ශේෂය භාණ්ඩාගාරයේ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත පියවා නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 371 හි සඳහන් විධිවිධානයන්ට පටහැනි ලෙස මාණ්ඩලික නොවන නිලධාරීන් දෙදෙනෙකුට අවස්ථා 02 කදී රු. 20,000 බැගින් එකතුව රු. 40,000 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

**(ඉ) පොදු තැන්පත් ගිණුම**

2012 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පොදු තැන්පත් ගිණුම් ශේෂය රු.108,886,902 ක් වූ අතර ඒ පිළිබඳ පහත සඳහන් විස්තර නිරීක්ෂණය කරන ලදී.

(i) වර්ෂ 2 ක් ඉක්ම වූ රු.16,481,925 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් සඳහා 2009 ,2010, 2011 සහ 2012 වර්ෂයන් වලදී ලබා දී තිබූ මුදලින් 2012 දෙසැම්බර් 31 දිනට රු. 2,748,540 මුදලක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 1.6 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

### 1.6.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් , දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03ක් සඳහා සංයුක්ත සැලැස්මක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වර්ෂය ආරම්භයේ දී පිළියෙල කල යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.6.2 වාර්ෂික ක්‍රියාකාර සැලැස්ම.

ඉහත 1.6.1 ජේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් පිළියෙල කල යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාර සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.6.3 වාර්ෂික කාර්යසාධන වාර්තා.

ඉහත 1.6.1 ජේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402(1) ප්‍රකාර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 ජූලි 10 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 1.6.4 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 1.6.5 අභ්‍යන්තර විගණනය.

2009 ජුනි 09 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු අංක ඩී.එම්.ඒ./2009(1) දරන චක්‍රලේඛයට අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් ඉදිරිපත් කල යුතු පහත සඳහන් වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

- ප්‍රාරම්භක / ප්‍රාථමික ඇගයීම් වාර්තා
- කාර්තු වාර්තා

**1.6.6 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

2009 ජුනි 09 දිනැති අංක ඩී.එම්.ඒ./2009 (1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6 වන වගන්තිය අනුව අවම වශයෙන් මාස 3කට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්විය යුතු වුවත් 2012 වර්ෂයේ එම කමිටුව රැස්වී තිබුණේ එක් අවස්ථාවක දී පමණි.

**1.7 වත්කම් කළමනාකරණය**

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජන වත්කම්**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය | අදාළ කාර්යාලය |
|---|---|---|---|---|
| (i) | මෝටර් වාහන | 03 | 1985 සිට | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| | වතුර බවුසර | 01 | 2012 නොවැම්බර් 19 සිට | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| (ii) | යන්ත්‍ර සූත්‍ර (ජායා පිටපත් යන්ත්‍ර) | 01 | 2011සිට | නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| (iii) | පරිගණක හා උපාංග | 19 | 2011සිට | නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| | | 19 | 2011 සිට | වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| (iv) | විදුලිජනක යන්ත්‍ර | 06 | 2005 සිට | කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |

| | | | | |
|---|---|---|---|---|
| (v) | වෙනත් වත්කම් | 3109 | 2011 සිට | නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| | | 193 | 2011 සිට | වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |

## 1.8 අනුකූල නොවීම්

### (අ) නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|---|
| (i) | **ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| | | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| | 2008 ජනවාරි 01 දිනැති 1350/13 දරන ගැසට් නිවේදනය | | රු.25,000 ට වැඩි ගෙවීම් සඳහා රු.25 ක මුද්දර ගාස්තු අය කර ගත යුතු වුවත්, එකතුව රු.261,483 ක් වූ ගෙවීම් 3 කට අදාළව මුද්දර ගාස්තු අයකර නොතිබුණි. |
| (ii) | **මුදල් රෙගුලාසි** | | |
| | | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය |
| | මු.රෙ. 104 (2), (3), (4) | - | අලාභ හානි පිළිබඳ ප්‍රාරම්භක වාර්තාව ඉදිරිපත් කිරීමට මාස 05 කට වඩා ගත වී තිබුණි. |
| | | - | අලාභ හානිය සිදු වූ දිනයේ සිට තුන් මසක් ඇතුලත ඉදිරිපත් කල යුතු පූර්ණ වාර්තාව මාස 22 ක් ගත වුවද ඉදිරිපත් කර නොතිබුණි. |
| | මු.රෙ. 753(1) | - | ආපදා භාණ්ඩ නිකුත් කිරීමේ දී පොදු 141 වැනි ආකෘතියේ නිකුත් කිරීම් ඇණවුම් පිළියෙල කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| මු.රෙ. 1646 | - | වාහන උපයෝජනය පිළිබඳ මාසික සාරාංශ සහ දෛනික ධාවන සටහන් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| මු.රෙ. 1653 | - | ගමන ආරම්භයේ සහ අවසානයේ මයිලෝ මීටරය පරීක්ෂා කර බලා රියදුරු විසින් ලියූ දෛනික සටහන් වාහනය පාවිච්චි කල නිළධාරියා විසින් සහතික කර නොතිබුණි. |

කින්නියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

---

| | | |
|---|---|---|
| මු.රෙ. 371 (2) (ඇ) | | අවස්ථා 05 කදී ගෙවන ලද එකතුව රු. 240,000 ක් වු තත්කාර්ය අතුරු අග්‍රිම මාස 04 කට වැඩි කාලයක් ගතවී ඇතත් පියවා නොතිබුණි. |

කනතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

---

| | | |
|---|---|---|
| මු.රෙ. 715 (2) (ආ), 751, 753 (2), 755 | | ගබඩා භාණ්ඩ පහසුවෙන් සොයා ගත හැකිවන පරිදි භාණ්ඩ ක්‍රමානුකූලව පෙළ ගස්වා නොතිබුණි. |
| | - | ගබඩාවට ලැබෙන භාණ්ඩ, බඩු ලේඛන පොතෙහි ඇතුලත් කර නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය. |
| | - | භාණ්ඩ භාරගන්නා නිළධාරීන් විසින් භාණ්ඩ ලැබීම් ඇණවුම් පිළියෙල කර නිකුත්කර නොතිබුණි. |
| | - | ගබඩාභාර නිළධාරීන් මාරු වී යාමේ දී අදාල පටිපාටීන් අනුගමනය කර නොතිබුණි. |

## 1.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් හා ව්‍යාපෘති ඉටුකිරීමේ දුර්වලතාවයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

### (අ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පහත සඳහන් ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිම කළ යුතු දිනය | 2012 දෙසැම්බර් 31 දින වන විට වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | රු. | | | රු. | |
| (I) | <u>කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</u> | | | | | |
| | ජයන්තිගම පෙර පාසල ඉදි කිරීම | 1,000,000 | 2012/04/25 | 2012/12/31 | 347,527 | අධික වර්ෂාව පැවතීම |
| | පන්සල් ගොඩැල්ල බෝගහ හන්දිය සිට ගොවිජන සේවා මධ්‍යස්ථානය දක්වා පාර කොන්ක්‍රීට් කිරීම | 1,000,000 | 2012/06/25 | 2012/12/31 | 122,364 | අධික වර්ෂාව පැවතීම |
| (II) | <u>පදවි ශ්‍රී පුර</u> | | | | | |
| | වී ගබඩා අළුත්වැඩියා කිරීම (140' x 40' ) | 5,100,000 | 2012/08/13 | 2012/12/13 | 2,336,112 | අධික වර්ෂාව පැවතීම |
| (III) | <u>මොරවැව</u> | | | | | |
| | වී ගබඩා අළුත්වැඩියා කිරීම - මොරවැව දකුණ ( 60' x 30') | 4,000,000 | 2012/07/09 | 2012/11/09 | 2,714,937 | අධික වර්ෂාව පැවතීම |
| | වී ගබඩා අළුත්වැඩියා කිරීම - මහදිවුල් වැව ( 60' x 30' ) | 4,000,000 | 2012/07/09 | 2012/11/09 | 1,451,917 | අධික වර්ෂාව පැවතීම |
| | පොහොර ගබඩා ගොඩනැගිල්ල ඉදිකිරීම | 1,000,000 | 2012/05/02 | 2012/11/02 | 421,116 | අධික වර්ෂාව පැවතීම |
| (IV) | <u>තඹලගමුව</u> | | | | | |
| | වී ගබඩා තුනක් අළුත්වැඩියා කිරීම (70' x 30' ) | 20,000,000 | 2012/07/13 | 2012/11/13 | 7,493,745 | අධික වර්ෂාව පැවතීම |
| (V) | <u>කින්නියා</u> | | | | | |
| | වී ගබඩා අළුත්වැඩියා කිරීම- මනියරසකුලම් (20' x 30') | 7,000,000 | 2012/07/16 | 2012/11/16 | 3,036,269 | අධික වර්ෂාව පැවතීම |
| (VI) | <u>සේරුවිල</u> | | | | | |
| | කාවන්තිස්සපුර පෙර පාසල් ගොඩනැගිල්ල ඉදි කිරීම | 1,000,000 | 2012/05/16 | 2012/11/16 | 663,849 | ඉදිරිපත් කර නොතිබුණි. |
| | දෙහිවත්ත බහු කාර්යය ගොඩනැගිල්ල (Multi Purpose) ඉදි කිරීම | 1,000,000 | 2012/04/23 | 2012/10/23 | 486,242 | ඉදිරිපත් කර නොතිබුණි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| සෝමාවතී පාරේ පිහිටි මීගස් වැව අළුත්වැඩියා කිරීම | 1,000,000 | 2012/06/19 | 2012/12/19 | 736,728 | ඉදිරිපත් කර නොතිබුණි. |

(ආ) ගම නැගුම ව්‍යාපෘති ඉදිකිරීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(I) <u>කින්නියා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය</u>

පහත සඳහන් ඉදිකිරීම්වල ප්‍රගතිය පිළිබඳ තාක්ෂණික නිලධාරීන් ද සමඟ සිදුකල ක්ෂේත්‍ර පරීක්ෂණවල දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | තථ්‍ය පිරිවැය<br>රු. | නිරීක්ෂණය වූ අඩුපාඩු |
|---|---|---|
| පල්හා පල්ලිය පාර ඉදිකිරීම. | 953,915 | පස් තැලීම නිසි පරිදි සිදු නොකිරීම හේතුවෙන් පාරේ ස්ථාන කිහිපයක් ගිලාබැස තිබීම. |
| මැද පල්ලිය පාර කොන්ක්‍රීට් කර ඉදිකිරීම. | 876,337 | කොන්ක්‍රීට් මාර්ගයේ ස්ථාන කිහිපයක් පුපුරා ගොස් තිබීම. |
| බිලාල් පල්ලිය පාර කොන්ක්‍රීට් කර ඉදිකිරීම. | 908,587 | කොන්ක්‍රීට් මාර්ගයේ ස්ථාන කිහිපයක් පුපුරා ගොස් තිබීම. |
| පනිච්චන්කුලම් පාර කොන්ක්‍රීට් කර ඉදිකිරීම. | 952,607 | කොන්ක්‍රීට් මාර්ගය දෙපස මාර්ග උරහිස් සකසා නොතිබීම. |
| පුතුකුඩිඉරුප්පු පාර පෙර නිම් ගල් ඇතිරීම. | 973,382 | මාර්ගය දෙපස අනුමත පස් යොදා සකස් කර නොතිබූ අතර පාරේ අඩක් පමණ වූ ප්‍රදේශයක් සම්පූර්ණයෙන්ම ගිලාබැස තිබීම. |

(II) <u>කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.</u>

පහත සඳහන් ඉදිකිරීම් පිළිබඳව තාක්ෂණික නිලධාරීන් සමඟන් සිදු කල ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී පහත දැක්වෙන අඩුපාඩු නිරීක්ෂණය විය.

i. <u>ලීලාරත්න ක්‍රීඩාංගණයේ සිට පරාක්‍රම මාවත දෙසට මාර්ගය කොන්ක්‍රීට් කිරීම (රු. 852,319)</u>

කොන්ක්‍රීට් මාර්ගයේ ස්ථාන 04 ක් ඉරිතලා තිබුණු අතර, තවත් ස්ථාන කිහිපයක කළු ගල් මතුවී තිබුණි. මේ අනුව භාවිතා කර තිබූ කොන්ක්‍රීට් මිශ්‍රණය නිසි ප්‍රමිතියකින් යුක්ත නොවන බව නිරීක්ෂණය විය.

ii. <u>සීවලී විද්‍යාලය සංවර්ධනය කිරීම (රු. 490,436)</u>

සීවලී විද්‍යාලය සංවර්ධනය කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුලදී, රු.490,436 ක් වැයකර තිබුණි. ඒ සඳහා පිළියෙල කර තිබූ ඇස්තමේන්තුවේ අයිතම අංක 2 යටතේ පරිගණක විද්‍යාගාරයේ ප්‍රධාන දොරෙහි පිත්තල සරනේරු හා උපාංග සවිකල යුතු වුවත් ඒ සඳහා යකඩ සරනේරු හා උපාංග සවිකර ඇස්තමේන්තුව ප්‍රකාර රු.27,440 ක් ගෙවා තිබුණි. එමෙන්ම අයිතම අංක 7 යටතේ පාසල් නාම පුවරුව සවිකිරීම සඳහා රු.22,000 ක් ගෙවා තිබුණත් අදාල නාම පුවරුව සවිකර නොතිබුණි. තවද අයිතම අංක 5 යටතේ පාසල වටා අඩි 550 ක වැටක් ඉදිකිරීම සඳහා රු.137,500 ක් ඇස්තමේන්තුව ප්‍රකාර ගෙවා තිබුණද, එකම පරිශ්‍රයේ පිහිටි පාසල් ගොඩනැඟිල්ල හා ක්‍රීඩා පිටිය වෙන්වන ලෙස අදාල වැට ඉදිකර තිබුණි. මේ නිසා ක්‍රීඩා පිටිය අනාරක්ෂිතවී තිබුණි.

iii. <u>ජයන්තිපුර උදාගිරි පෙර පාසල ඉදිකිරීම ( රු. 980,392.16)</u>

ඇස්තමේන්තු අයිතම අංක 09 යටතේ වූ දොර ජනෙල් සවි කිරීම සඳහා රු. 45,207 ක් ගෙවා තිබුණි.

- ඇස්තමේන්තු ප්‍රකාරව පළමු පංතියේ දැව භාවිතා කළ යුතු වුවත් , කෂේත්‍ර පරීක්ෂණය අනුව භාවිතා කර තිබූ දැව වර්ගයේ ප්‍රමිතිය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි විය.
- උළුවස්සෙහි උස අඩි 7 ක් විය යුතු වුවද , සවි කර තිබූ උළුවහු 3න් එකක් උස අඩි 5 අඟල් 10 ක් හා ඉතිරි දෙකෙහි උස ඊට අඩු බව නිරීක්ෂණය විය.

- පිත්තල දොර සරනේරු සහ උපාංග සවි කල යුතු වුවද, යකඩ සරනේරු සහ උපාංග සවිකර තිබුණි.

## 1.10 ගැලපුම් කළ යුතු ශේෂ

ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා එයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 විසින් 2012 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබූ බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව අනාවරණය වූ තොරතුරු පහත දැක්වේ.

| **ගැලපුම් පිළිබඳ විස්තරය** | **කාල විශ්ලේෂණය** | | |
|---|---|---|---|
| | **මාස 06 ට වැඩි වර්ෂ 01 ට අඩු** | **වර්ෂ 01 ට වැඩි 03 ට අඩු** | **එකතුව** |
| | රු. | රු. | රු. |
| නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් | 116,672 | 284,290 | 400,962 |

## 1.11 අවිධිමත් ගණුදෙනු

**ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැර වීම**

ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් එළඹ තිබුණු සමහර ගණුදෙනු විධිමත් බවින් තොර වූ අවස්ථා නිරීක්ෂණ විය.

කන්තලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින්, ප්‍රසම්පාදන උපදෙස් මාලාවේ 5.4.4 වගන්තිය ප්‍රකාර පිළිගත හැකි ඇප සුරක්ෂිත ලබා ගැනීමකින් තොරව ඉදිකිරීම් ව්‍යාපෘති 24 ක් සඳහා කොන්ත්‍රාත්කරුවන්හට රු. 3,920,000 ක් වැඩ ආරම්භක අත්තිකාරම් ගෙවා තිබුණි.

## 1.12 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් දුර්වලතාවයන් නිරීක්ෂණය විය.

(අ) සමෘද්ධි බැංකු ණය වාරික අයකර ගැනීම් පිළිබඳ නියැදි විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූ පරිදි හිඟ ණය වාරික අයකර ගැනීමට වසර 3 කට වැඩි කාලයක් ගත වී තිබුණද, ඒ සඳහා ක්‍රියා කර නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය. විවිධ කාර්යයන් සඳහා නිකුත් කර තිබූ ණය මුදලින් 2012 වර්ෂය අවසානය වන විට එසේ අයකර ගත යුතුව තිබූ හිඟ ණය වාරික පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | 2012 දෙසැම්බර් 31 දිනට හිඟ ණය වාරික මුදල |
|---|---|
| | රු. |
| නගර හා කඩවත් | 2,610,293 |
| වෙරුගල් | 2,813,350 |

(ආ) නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අංශයට 2008 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ඉදිරිපත් කර ඇති ඉඩම් ඔප්පු 162 ක් ලියාපදිංචි කර නොතිබූ අතර, ලියාපදිංචි කරන ලද ඉඩම් ඔප්පු 38 ක් හිමිකරුවන් වෙත ලබා දී නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉඩම් අංශය විසින් 2007 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා ලියාපදිංචි කළ ඉඩම් ඔප්පු 96 ක් හිමිකරුවන් වෙත ලබා දී නොතිබුණි.

(ඈ) දිස්ත්‍රික් මිල තීරණය කිරීමේ කමිටුව විසින් විවිධ අයිතම 106 ක් වෙනුවෙන් 2012 වර්ෂයේ මිල ගණන් තීරණය කර තිබුණි. එම මිල ගණන් මත පදනම්ව එක් එක් ඉදි කිරීම ඇස්තමේන්තු අයිතම වෙනුවෙන් මිල විශ්ලේෂණයක් සකස් කර නොතිබුණි. ඒ හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඇස්තමේන්තු සකස් කිරීමේදී සංගතභාවයකින් තොරවූ අතර එකම කාර්යය සඳහා විවිධ මිල ගණන් භාවිතා කල අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | ඇස්තමේන්තු වැඩ විස්තරය | යොදාගත් මිල ගණන් - වෙරුගල් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | යොදාගත් මිල ගණන් - නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
|---|---|---|---|
| | | රු. | රු. |
| (i) | පවතින මාර්ග තලයේ මුල් පිහිටීම මට්ටම් කැපීම, මට්ටම් කිරීම සහ තැලීම .<br>(Trimming & leveling campering and compaction of original ground to 100 % compaction within the existing road way) | 52 | 67 |
| (ii) | මාර්ග තලය සකස් කිරීම සඳහා අනුමත තත්වයේ පස් (CBR20 ට වැඩි) කපා සපයා ගොනු කිරීම, ප්‍රවාහන ගාස්තු හා තැලීමේ ගාස්තු ඇතුළත්ව .<br>(Excavation supply and pilling approved quality soil (CBR >20) for bas construction of carriage way including transport and compaction.) | 1,280 | 1,880 |
| (iii) | මිලිමීටර 150 × 225 ප්‍රමාණයේ මාර්ග බැම් කොන්ක්‍රීට් 1:2:4 (මිලිමීටර 19) (හැරීමේ හා සැටරින් වැඩ ඇතුලත්ව). | | |

| | | | |
|---|---|---|---|
| | (150 × 225 mm) kerb wall in 1:2:4 (19mm) concrete (Rate inclusive of excavation formwork) | 500 | 543 |
| (iv) | මාර්ග උරහිස් සැකසීම සඳහා අනුමත තත්වයේ පස් (CBR20 ට වැඩි) කපා සපයා ගොනු කිරීම, ප්‍රවාහන ගාස්තු හා තැලීමේ ගාස්තු ඇතුළත්ව. (Excavation supply and pilling approved qulity soil (CBR > 20) for shoulder including transport and compaction.) | 1,280 | 1,935 |

(ඉ) 2012 දෙසැම්බර් මස ඇති වූ අධික වර්ෂාව හා ගංවතුර හේතුවෙන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ආපදාවට පත් ජනතාව වෙනුවෙන් බෙදා දීමට 2012 දෙසැම්බර් 28 වැනි දින ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය විසින් ද්‍රව්‍ය සහනාධාර ලබා දී තිබුණි. එම ද්‍රව්‍ය සහනාධාර ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් 2013 ජූලි මස වන විටත් බෙදා දී නොතිබුණි.

| භාණ්ඩ වර්ගය | ප්‍රමාණය |
|---|---|
| ඇඳ ඇතිරිලි ( තුවා , බ්ලැන්කට් ) | 550 |
| පැදුරු | 500 |
| ප්ලාස්ටික් පිඟන් | 750 |
| ගම් බූට් | 25 |
| වතුර පිරිසිදු කරන බෙහෙත් පෙති | 4000 |

(ඊ) පහත දැක්වෙන පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් නිකුත් කරන ලද චෙක්පත් අදාල පාර්ශවයන් වෙත නිකුත් නොකර රඳවා ගෙන තිබූ බව නිරීක්ෂණය විය.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | චෙක්පත් සංඛ්‍යාව | වටිනාකම | නිකුත් නොකර රඳවා තබාගෙන ඇති කාල සීමාව |
|---|---|---|---|
| | | රු. | |
| කුච්චවේලි | 26 | 447,182 | මාස 06 සිට මාස 15 |
| කින්නියා | 09 | 135,987 | මාස 01 සිට මාස 07 |

## 1.13 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2012 දෙසැම්බර් 31 දිනට වූ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 හි සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 39 | 26 | 13 | - |
| (ii) | තෘතියික මට්ටම | 35 | 13 | 22 | - |
| (iii) | ද්විතියික මට්ටම | 725 | 378 | 347 | -- |
| (iv) | ප්‍රාථමික මට්ටම | 145 | 112 | 33 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 07 | - | 07 |
| | **එකතුව** | 944 | 536 | 415 | 07 |